# ගල් අඟුරු ගෙන්වීම් ගැන සොයන්න ත්‍රිපුද්ගල කමිටුවක්

## ත්‍රිපුද්ගල කමිටුවේ සාමාජිකයෝ අද පත් කරති?

■ චාමර සම්පත්

ශ්‍රී ලංකාවට අවශ්‍ය ගල් අඟුරු මිලදීගෙන ගෙන්වීමේ දී අක්‍රමිකතාවක් සිදුවී ඇතිද යන්න පිළිබඳ පූර්ණ විමර්ශනයක් කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කරන බව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතා "අද" ට පැවසීය.

මෙම ත්‍රිපුද්ගල කමිටුවට අදාළ ත්‍රිපුද්ගල සාමාජිකයන් තමා විසින් අද (11දා) දිනයේදී පත්කිරීමට බලාපොරොත්තු වන බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

"මේතෙක් ගල් අඟුරු මිලදී ගැනීමේ ක්‍රියාවලියත්, මේ වනවිට කතාබහට ලක්වී තිබෙන කාරණා සම්බන්ධයෙනුත් විශේෂයෙන් සොයාබැලීමටත් තීරණය කළා. එනිසයි ඒ සඳහා කමිටුවක් පත්කිරීමට තීරණය කළේ.

ගල් අඟුරු මිලදී ගැනීමේ ටෙන්ඩර් පටිපාටිය සොයාබැලීමටත් එයින් රටට අලාභයක් සිදුවී ඇතිද යන්න කරුණු පිළිබඳව මෙම කමිටුව හරහා සොයාබැලීමට බලාපොරොත්තු වෙනවා. මෙම කමිටුවට ඉතාම ස්වාධීන දැන උගත් පුද්ගලයන් තුන් දෙනෙකු පත්කරනවා. එමෙන්ම මෙම කමිටුවේ විමර්ශන වාර්තාව ලබාගැනීමටත් බලාපොරොත්තු වෙනවා. පසුව එම වාර්තාව කැබිනට් මණ්ඩලයටත් ඉදිරිපත්කර සම්පූර්ණ වාර්තාව පිළිබඳ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මම කටයුතු කරනවා" යැයි රංජිත් සියඹලාපිටිය මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

මේ අතර, ගල් අඟුරු මිලදී ගැනීමකදී රුපියල් බිලියන 1.2 ට ආසන්න මුදලක් රටට අහිමිකළ බව කියමින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පසුගිය පෙත්සමක් ගොනුකරනු ලැබීය.

මේසඳහා වන මූලික අයිතිවාසිකම් නඩුව සිංගප්පූරුවේ සමාගමක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනුකරන ලද අතර කැබිනට් මණ්ඩලයම මෙහි වගඋත්තරකරුවන් කර තිබිණි.

PAGE 4

PAGE 1

## ගල් අඟුරු ගෙන්වීම් ගැන...

එම සමාගමේ මෙරට නියෝජිතයෙකු නොසිටීමත් ඔවුන් ඉදිරිපත් කළ පෙත්සම සහතික කර තිබුණේ ලාංකිකයෙකු නොවීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මෙම පෙත්සම නිෂ්ප්‍රභ කළද මෙම සිදුවීමෙන් අධිකරණයේ හෘද සාක්ෂිය කම්පනය වූ නිසා නඩුව විභාග කරන බව ප්‍රකාශ කළේය. එය අංක SC FR NO. 394/2015 දරණ නඩු තීන්දුවෙහි පැහැදිලිව සඳහන් වේ.

ගල් අඟුරු මෙට්‍රික් ටොන් එකක් ඇමරිකානු ඩොලර් 46.62 කට මිලදී ගැනීමට හැකියාව තිබියදී ඩොලර් 54.41 කට මෙට්‍රික් ටොන් 1,064,724 ක් මිලදී ගෙන ඇති බවත් මෙහිදී අනාවරණය විය.

ගල් අඟුරු මිලදී ගැනීමට අදාළ ටෙන්ඩර් පිළිබඳව තීරණ ගනු ලබන්නේ පාර්ලිමේන්තු ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික කමිටුව වන අතර, පාර්ලිමේන්තු ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවෙහි සභාපති ලෙස විදේශ කටයුතු අමාත්‍යාශ ලේකම් පී.එස්. විතානගේ මහතා කටයුතු කරයි.

එමෙන්ම විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් ආචාර්ය සුරේන් බටගොඩ විදුලිබල මණ්ඩල සාමාන්‍යාධිකාරී එම්.සී. වික්‍රමසිංහ මහත්වරු ඇතුළු නිලධාරීහු පිරිසක් මෙහි සාමාජිකයෝ ලෙස කටයුතු කරති.

ගල්අඟුරු ගෙන්වීම සම්බන්ධ සිදුවීම් සියල්ල පුළුල් ලෙස අධ්‍යයනය කිරීමෙන් අනතුරුව එය පූර්ණ ලෙස විදුලිබල මණ්ඩලය යටතට පවරා ගැනීමටත් ගල් අඟුරු ගෙන්වීම විදුලිබල මණ්ඩලය යටතේ සිදුකිරීමටත් බොහෝදුරට ඉඩඇතැයි විදුලිබල මණ්ඩල ආරංචි මාර්ග සඳහන් කරයි.

ලංකා ගල් අඟුරු සමාගම විදුලිබල මණ්ඩලය යටතේම පවතින සමාගමක් වන අතර, එය ගල් අඟුරු මිලදී ගැනීමේදී අතරමැදි කාර්ය සිදුකරනු ලබයි. ලංකා ගල් අඟුරු සමාගමේ සභාපති ලෙස මෛත්‍රී ගුණරත්න මහතා කටයුතු කරන අතර, වසරක් තුළ වැඩිම ගල් අඟුරු ප්‍රමාණය මේ වසරේදී ගෙනඒමට හැකිවූ බව ඔහු වරෙක ප්‍රකාශ කළේය.